සැබැවින්ම මුස්ලිම්වරයා තම සහෝදර මුස්ලිම්වරයාගේ සුවදුක් විමසන විට ඔහු නැවත හැරී එන තෙක් ස්වර්ගයේ ඵල නෙළීමෙහි අඛණ්ඩව සිටිනු ඇත.

නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා පැවසූ බව සව්බාන් -රළියල්ලාහු අන්හු- තුමා
විසින් වාර්තා කරන ලදී. "සැබැවින්ම මුස්ලිම්වරයා තම සහෝදර මුස්ලිම්වරයාගේ
සුවදුක් විමසන විට ඔහු නැවත හැරී එන තෙක් ස්වර්ගයේ කුර්ෆාහි (ඵල නෙළීමෙහි) අඛණ්ඩව සිටිනු ඇත. (එවිට) අහෝ අල්ලාහ්ගේ දූතයාණනි, ස්වර්ගයේ කුර්ෆා යනු කුමක්දැ?යි
විමසන ලදී. එතුමා එහි නෙළීමය යැයි පැවසූහ.
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත]

නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා පැවසූ බව සව්බාන් -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලද හදීසෙයහි "සැබැවින්ම මුස්ලිම්වරයා තම සහෝදර මුස්ලිම්වරයාගේ සුවදුක් විමසන විට" යැයි සඳහන්ව අැත. එනම් ඔහු රෝගාතුර ව සිටින තත්ත්වයේ. එවිට ඔහු ස්වර්ගයේ කුර්ෆාහි (ඵල නෙළීමෙහි) අඛණ්ඩව සිටිනු ඇත. (එවිට) අහෝ අල්ලාහ්ගේ දූතයාණනි, ස්වර්ගයේ කුර්ෆා යනු කුමක්දැ?යි විමසන ලදී. එතුමා එහි නෙළීමය යැයි පැවසූහ. එනම් එම රෝගියා අසළ වාඩිවී සිටින තාක්කල් ඔහු ස්වර්ගයේ පලතුරු නෙළනු ඇත. රෝගියාගේ සුවදුක් විමසන්නා දරණ කුසල ස්වර්ගයේ පළතුරු නෙළීමට සමාන කොට ඇත. එමෙන්ම මෙයින් අදහස් වනුයේ මාර්ගය යැයි ද පවසනු ලැබ ඇත. එහි අර්ථය සුවදුක් විමසන්නා ස්වර්ගය වෙත වූ මාර්ගය සඳහා තම වගකීම් ඉටු කරමින් ගමන් කරනු ඇත යන්නයි. පළමු විග්රහය වඩාත් උචිත වන්නේය. රෝගියා අසළ වාඩි වී සිටීම තත්ත්වයන් හා පුද්ගලයින්ගේ වෙනස්කම් අනුව වෙනස් වන්නේය. ඇතැම් විට රෝගියා අසල වාඩි වී සිටීම බලකරනු ඇත. ඇතැම් විට එසේ බල කිරීමක් සිදු නොවේ. සැබැවින්ම එම මිනිසා රෝගියාට වඩාත් සමීප යැයි හඳුනා ගනු ලැබ, තමන් අසල මදක් ප්රමාද වීම රෝගියා ප්රිය කරන්නේ නම් වඩාත් උතුම් වනුයේ ඔහු අසළ එසේ ප්රමාද වීමය. නමුත් සුවදුක් විමසන්නා අඩු කාලයක් ගත යුතු යැයි රෝගියා ප්රිය කරන්නේ නම් එවිට ප්රමාද කරනු නොලැබේ. සෑම තැනකටම එයට සරිලන ප්රකාශයක් ඇත.

http://sunnah.global/hadeeth/si/show/5647